**ශීර්ෂය 273 - පුත්තලම දිස්ත්‍රික් ලේකම් කාර්යාලය පිළිබඳ විගණකාධිපති වාර්තාව 2016 වර්ෂය**

ශීර්ෂය 273- පුත්තලම දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය වාර්තා, පොත්පත්, ලේඛන හා අනෙකුත් වර්තා අන්තර්ගත වූ විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදී. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තාව 2017 ජුනි 10 දින දිස්ත්‍රික් ලේකම්වරයා වෙත නිකුත් කරන ලදී. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයා ගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය හා ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාලවේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

**1.2 ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම**

විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148,149,150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රාජ්‍ය මූල්‍ය හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වාගෙන යාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළවන අභ්‍යන්තර පාලනයන් සැලැසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම හා පවත්වාගෙන යාමත් මෙම වගකීමට ඇතුළත් වේ.

**2. ගිණුම්**

**2.1 විසර්ජන ගිණුම**

**(අ) මුළු ප්‍රතිපාදනය හා වියදම**

දිස්ත්‍රික් ලේකම් කාර්යාලය සඳහා සලසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනය රු. මිලියන 724.64 වූ අතර, සමාලෝචිත වර්ෂය අවසාන වන විට ඉන් රු. මිලියන 709.13 ක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව ශුද්ධ ප්‍රතිපාදනයෙන් රු. මිලියන 15.51 ක් හෙවත් සියයට 2.14 ක් ඉතිරි වී තිබුණි. විස්තර පහත දැක්වේ.

| වියදම | 2016 දෙසැම්බර් 31 දිනට | | | ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|---|
| | ශුද්ධ ප්‍රතිපාදනය | උපයෝජනය | ඉතිරිය | |
| | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | |
| පුනරාවර්තන | 649.64 | 644.80 | 4.84 | 0.75 |
| මූලධන | 75.00 | 64.33 | 10.67 | 14.23 |
| **එකතුව** | **724.64** | **709.13** | **15.51** | **2.14** |

**(ආ) වෙනත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු විසින් ලබාදුන් ප්‍රතිපාදන උපයෝජනය**

විවිධ කාර්යයන් සඳහා වෙනත් අමාත්‍යාංශ 26 ක් හා දෙපාර්තමේන්තු 18 ක් විසින් දිස්ත්‍රික් ලේකම් කාර්යාලය වෙත එකතුව රු.මිලියන 3,160.51 ක් වූ ප්‍රතිපාදන ලබා දී තිබුණු අතර, සමාලෝචිත වර්ෂය අවසාන වන විට ඉන් රු.මිලියන 2,364.08 ක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව ලබා දී තිබුණු ප්‍රතිපාදනවලින් රු.මිලියන 796.43 ක් හෙවත් සියයට 25.20 ක ප්‍රතිපාදන ඉතිරි වී තිබුණි.

**2.2 අත්තිකාරම් ගිණුම**

**රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම**

**පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන්**

දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට අදාළ විෂය අංක 27301 දරන රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම වෙනුවෙන් පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන් හා තථ්‍ය අගයන් පහත දැක්වේ.

| වියදම | | ලැබීම් | | හර ශේෂය | |
|---|---|---|---|---|---|
| උපරිම සීමාව | තථ්‍ය | අවම සීමාව | තථ්‍ය | උපරිම සීමාව | තථ්‍ය |
| රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන |
| 47.00 | 46.79 | 34.00 | 41.27 | 170.00 | 144.03 |

**2.4 පොදු තැන්පත් ගිණුම**

පුත්තලම දිස්ත්‍රික් ලේකම් කාර්යාලය යටතේ වන තැන්පත් ගිණුම් 07 ක 2016 දෙසැම්බර් 31 දිනට ශේෂවල එකතුව රු. මිලියන 306.04 ක් විය. විස්තර පහත දැක්වේ.

| තැන්පත් ගිණුම් අංකය | 2016 දෙසැම්බර් 31 දිනට ශේෂය |
|---|---|
| | රු.මිලියන |
| 6000/0000/00/0001/0070/000 | 0.76 |
| 6000/0000/00/0002/0095/000 | 1.97 |
| 6000/0000/00/0013/0063/000 | 77.36 |
| 6000/0000/00/0016/0046/000 | 208.58 |
| 6000/0000/00/0017/0016/000 | 8.39 |
| 6000/0000/00/0019/0009/000 | 8.26 |
| 6000/0000/00/0020/0003/000 | 0.72 |
| **එකතුව** | **306.04** |

## 2.5 විගණන නිරීක්ෂණය

පුත්තලම දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ඉහත 1.1 ඡේදයේ දක්වා ඇති කළමනාකරණ විගණන වර්තාවේ සඳහන් විගණන නිරීක්ෂණවලට යටත්ව සතුටුදායක ලෙස පිළියෙල කර තිබුණි. එම කළමනාකරණ විගණන වාර්තාව ඇතුළත් විගණන නිරීක්ෂණවලින් ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ 3 ඡේදයේ සඳහන් කර ඇත.

## 3. ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ

### 3.1 ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම

දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් මුදල් රෙගුලාසි 1647(ඉ) ප්‍රකාර වාහන ලැයිස්තුගත කිරීමේ ලේඛනයක් පවත්වා නොතිබුණු අතර දිස්ත්‍රික් ලේකම් කාර්යාලය හා ප්‍රාදේශීය ලේකම් කාර්යාල විසින් පහත දැක්වෙන ලේඛන විධිමත්ව හා යාවත්කාලීනව පවත්වා නොතිබුණු බව නියැදි විගණන පරීක්ෂණවල දී නිරීක්ෂණය විය.

| | ලේඛන වර්ගය | අදාල රෙගුලාසිය |
|---|---|---|
| (i) | ස්ථාවර වත්කම් ලේඛනය | 1978 දෙසැම්බර් 19 දිනැති අංක 842 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය |
| (ii) | පරිගණක උපාංග හා මෘදුකාංග පිළිබඳ වත්කම් ලේඛනය | 2002 නොවැම්බර් 28 දිනැති අංක I AI/2002/02 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය |
| (iii) | හානි පිළිබඳ ලේඛනය | මුදල් රෙගුලාසි 110 |
| (iv) | බැරකම් පිළිබඳ ලේඛනය | මුදල් රෙගුලාසි 214 |
| (v) | දෙපාර්තමේන්තු විසර්ජන (සම්මත වැය) ලෙජරය | මුදල් රෙගුලාසි 447 |
| (vi) | විගණන විමසුම් ලේඛනය | මුදල් රෙගුලාසි 452(1) |
| (vii) | විදුලි උපකරණ ලේඛනය | මුදල් රෙගුලාසි 454(2) |
| (viii) | ණය ලේඛනය | මුදල් රෙගුලාසි 485 |
| (ix) | ඇප ලේඛන | මුදල් රෙගුලාසි 891(1) |
| (x) | මාසික ධාවන සටහන් හා මාසික සාරාංශ | ලංකාණ්ඩුවේ මුදල් රෙගුලාසි 1646 |

### 3.2 විගණන විමසුම්වලට පිළිතුරු දීම

දිස්ත්‍රික් ලේකම් කාර්යාලය වෙත සමාලෝචිත වර්ෂයේදී ඉදිරිපත් කරන ලද විගණන විමසුම් 06 කට 2017 ජුනි 29 දින වන විටත්, පිළිතුරු ඉදිරිපත් කර නොතිබුණි. එම විමසුම්වලට අදාළ ගණනය කළ හැකි ගනුදෙනුවල වටිනාකම රු.91,894,220 ක් විය.

## 3.3 විසර්ජන ගිණුම

----------------

**අයවැය විචලනය**

-------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2015 දෙසැම්බර් 29 දිනැති අංක 7/2015 දරන අයවැය චක්‍රලේඛයට ප්‍රකාරව, 1202 වැය විෂය යටතේ සලසා තිබුණු ප්‍රතිපාදනවලින් සියයට 15 ක ප්‍රතිපාදන අනිවාර්යෙන්ම ඉතිරි කළ යුතු වුවත්, 273-1-1-1202 හා 273-1-2-1202 වැය විෂයයන් දෙකෙන් ඉතිරි කර තිබුණු ප්‍රතිපාදනය පිළිවෙලින් සියයට 13 ක් හා සියයට 11 ක් වී තිබුණි. .

(ආ) ව්‍යාපෘතිය 01 හි වැය විෂය 2104 යටතේ සලසා තිබුණු ප්‍රතිපදනයෙන් උපයෝජනය කිරිම සඳහා ප්‍රමාණවත් අග්‍රිමයන් නොලැබීම නිසා සමාලෝචිත වර්ෂය අවසාන වන විට රු. 10,630,535 ක ප්‍රතිපාදන ඉතිරිවී තිබුණි.

## 3.4 පොදු තැන්පත් ගිණුම

-----------------------

දිස්ත්‍රික් ලේකම් කාර්යාලය හා ඒ යටතේ වන ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල පොදු තැන්පත් ගිණුම්වල ශේෂ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) විගණනය වෙත සපයා තිබූ තොරතුරුවලට අනුව අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, සංස්ථා, මණ්ඩල, හා අධිකාරිවලින් විවිධ කාර්යයන් ඉටු කිරිම සඳහා ප්‍රාදේශීය ලේකම් කාර්යාල 08 කට ලබාදී තිබුණු ඒකතුව රු.33,190,607 ක්වූ මුදල් අදාළ කාර්යයන් ඉටු නොකර හෝ ඉටුකළ පසු ඉතිරිවීම් වශයෙන් තැන්පත් ගිණුම්වල රඳවාගෙන තිබුණි.

(ආ) එමෙන්ම පෞද්ගලික ආයතන හා රාජ්‍ය නොවන සංවිධාන 05 ක් විසින් විවිධ කාර්යයන් සඳහා ප්‍රාදේශීය ලේකම් කාර්යාල 03 කට ලබාදී තිබුණු රු.3,349,583 ක් අදාළ කාර්යයන් ඉටු නොකර හෝ ඉටු කළ පසු ඉතිරිවීම් වශයෙන් තැන්පත් ගිණුමේ රඳවාගෙන තිබුණි.

(ඇ) පල්ලම ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් 2016 දෙසැම්බර් 31 දිනට රු.5,837 ක හඳුනා නොගත් තැන්පත් ශේෂයක් වූ අතර, එය හඳුනාගෙන නිරවුල් කිරීමට සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් පියවර ගෙන නොතිබුණි.

(ඈ) පල්ලම ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් 2016 දෙසැම්බර් 31 දිනට “සිගාස්” පරිගණක මාසික ගිණුම් වාර්තාව හා පොදු තැන්පත් ලේඛනය අනුව තැන්පත් ගිණුමේ රු.93,100 ක වෙනසක් පැවැතුණි.

(ඉ) මුදල් රෙගුලාසි 571(1) ප්‍රකාර පොදු තැන්පත් ගිණුමේ ශේෂ පිළිබඳව අර්ධ වාර්ෂික වාර්තා පිළියෙල කර විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

## 3.5 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ සැසඳුම් ප්‍රකාශය

-----------------------------------------------------------------

විෂය අංක 27301 දරන රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ 2016 දෙසැම්බර් 31 දිනට වූ සැසඳුම් ප්‍රකාශය සම්බන්ධයෙන් සිදුකළ නියැදි විගණන පරීක්ෂාවේ දී පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

(අ) විගණනයට ඉදිරිපත් කළ සැසඳුම් ප්‍රකාශය ප්‍රකාරව එදිනට අයවීම හිඟ හිට තිබුණු ශේෂවල එකතුව රු.4,536,663 ක් වූ අතර, එම හිඟ හිටි ශේෂ මාස 03 ක සිට වර්ෂ 05 ක් දක්වා කාල පරාසයක සිට පැවැත එමින් තිබුණත්, එම හිඟ හිටි ණය ශේෂ අයකර ගැනීමේ පසුවිපරම් කටයුතු දුර්වල තත්ත්වයක පැවතුණි.

(ආ) දිස්ත්‍රික් ලේකම් කාර්යාලය යටතේ වූ පුත්තලම හා ආණමඩුව ප්‍රාදේශීය ලේකම් කාර්යාල දෙකෙහි නිලධාරීන් දෙදෙනෙකුට ආපදා ණය ගෙවීමේදී පිළිපැදිය යුතු විධිවිධානවලට අනුකූල නොවන පරිදි රු.536,190 ක් ආපදා ණය ගෙවා තිබුණි.

(ඇ) කරුවලගස්වැව ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ රියදුරු මහතෙකුගේ 2016 ඔක්තෝබර් මාසයට අදාළව අයකරන ලද ණය වාරික හා පොලිය රු.6,415 ක් ණය ලේඛනයේ සටහන් කර නොතිබූ අතර, කළමනාකරණ සහකාර නිලධාරිණියගේ ඉහත කී මාසයේදී උත්සව අත්තිකාරම් වාරිකය රු.1,250 ක් අයකර නොතිබුණත්, අයකළ බවට ණය ලේඛනයේ සටහන් කර තිබුණි.

(ඈ) ආරච්චිකට්ටුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ නිලධාරියෙකුගේ පියවන ලද උත්සව අත්තිකාරම් රු.1,250 ක ශේෂය දෙවරක් සටහන් කිරීමද, මාදම්පේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ සිට ස්ථාන මාරු වූ නිලධාරියෙකුගේ රු.85,824 ක ණය ශේෂය දෙවරක් පියවීමද සිදුකර තිබුණි. එමෙන්ම මුන්දලම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ සේවකයකුගේ ණය වාරිකය රු.50 ක් අඩුවෙන් සටහන් කිරීමද සිදුකර තිබුණි.

**3.6 යහපාලනය හා ගිණුම් කටයුතුභාවය**

-----------------------------------------

**අභ්‍යන්තර විගණනය**

-----------------------

පුත්තලම දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් අභ්‍යන්තර විගණන ඒකකයක් ස්ථාපිත කර තිබූ අතර, සමාලෝචිත වර්ෂයේ දී දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ ප්‍රමාණවත් අභ්‍යන්තර විගණනයක් සිදු කර නොතිබුණි.

**3.7 වත්කම් කළමනාකරණය**

---------------------------

දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ වත්කම් සම්බන්ධයෙන් සිදු කළ නියැදි විගණන පරීක්ෂාවේදී පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

**(අ) නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්**

-------------------------------------------

පහත වර්ග කර ඇති පරිදි දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට අයත් සමහර වත්කම් නිෂ්ක්‍රීයව හෝ ඌන උපයෝජිතව පැවති බව නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය විය.

| වත්කම් වර්ගය | ඒකක ගණන | නිෂ්ක්‍රීයව හෝ ඌන උපයෝජිතව පැවති කාලය |
|---|---|---|
| ඉඩම් | 07 | වර්ෂ 2 කට වැඩි |
| ගොඩනැගිලි | 07 | - එම - |
| මෝටර් වාහන | 06 | - එම - |

**(ආ) වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ පැවැත්වීම**

2016 වර්ෂයට අදාළ සමීක්ෂණ මණ්ඩල වාර්තාවලින් පෙන්වා දී තිබුණු අතිරික්ත, ඌනතා හා වෙනත් නිර්දේශ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි පරිදි කටයුතු කර නොතිබුණි.

**(ඇ) බාහිර පාර්ශවයන් වෙත දී ඇති වත්කම්**

පුත්තලම දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් ඇතැම් වත්කම් අවිධිමත් ලෙස බාහිර පාර්ශවයන් වෙත මුදාහැර තිබුණු අවස්ථා නිරීක්ෂණය විය. විස්තර පහත දැක්වේ.

| වත්කම් වර්ගය | ලබාදී ඇති ආයතනය | වටිනාකම | කාලපරිච්ඡේදය |
|---|---|---|---|
| | | රු. | |
| ඉඩම් | පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව | තක්සේරු කර නැත | දක්වා නැත. |
| | සංස්කෘතික මධ්‍යස්ථානය | 12,000,000 | - එම - |
| | සුරා බදු ගොඩනැඟිල්ල | 10,000,000 | - එම - |
| | ක්‍රීඩා සංගමය | තක්සේරු කර නැත | - එම - |
| | පුනරුත්තාපන කාර්යාලය | 4,000,000 | - එම - |
| | වයිල්ඩ් විෂන් ආයතනය | 6,450,000 | 2016.06.30 දක්වා |
| ගොඩනැඟිලි | පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව | තක්සේරු කර නැත | දක්වා නැත. |
| | සංස්කෘතික මධ්‍යස්ථානය | 2,000,000 | - එම - |
| | සුරා බදු ගොඩනැඟිල්ල | 1,300,000 | - එම - |
| | වර්ල්ඩ් විෂන් ආයතනය (මුන්දලම පැරණි ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ) | 79,000,000 | අවු.02ට වැඩි |
| | ක්‍රීඩා සංගමය | තක්සේරු කර නැත | - එම - |
| | පුනරුත්තාපන කාර්යාලය | 1,000,000 | - එම - |
| | වයිල්ඩ් විෂන් ආයතනය | 1,550,000 | වර්ෂ 2 ක සිට |

**(ඈ) වෙනත් ආයතන සතු වත්කම් පරිහරණය කිරීම**

නවගත්තේගම ප්‍රාදේශීය ලේකම් කාර්යාලය වෙත පුද්ගලික ආයතනයකින් හා ආපදා කළමනාකරණ අමාත්‍යාංශයෙන් එකතුව රු.3,500,000 ක් වටිනා ට්‍රැක්ටරයක් හා ජල බවුසරයක් ලබාදී තිබුණු අතර, එම වත්කම් සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් භාවිතයට ගෙන නොතිබුණි.

**(ඉ) පවරා නොගත් වත්කම්**

**------------------------**

දංකොටුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ සෙන්දිරියාමුල්ල ඇටබගහවත්ත ජනපදයේ පානීය ජල ව්‍යාපෘතිය සඳහා රු.1,173,239 ක් වැයකර තිබුණද, එහි ළිඳ පිහිටි ඉඩම දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට පවරාගෙන නොතිබුණි.

**3.8 බේරුම් නොකළ බැරකම්**

**----------------------------**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) පුත්තලම දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් 2016 දෙසැම්බර් 31 දිනට වර්ෂ 01කට අඩු කාලයක සිට පැවත එන බේරුම් නොකළ බැරකම් රු.1,717,329 ක් විය.

(ආ) එක් වැය විෂයයක් සඳහා සලසා තිබුණු ප්‍රතිපාදනය මුළුමණින්ම උපයෝජනය කර තිබුණත්, තවදුරටත් එම වැය විෂයේ ප්‍රතිපාදන නොතිබියදී සමාලෝචිත වර්ෂය අවසන් වන විට රු.22,175 ක බැරකම්වලට එළඹ තිබුණි.

**3.9 අනුකූල නොවීම්**

**-----------------**

**නීති,රීති, රෙගුලාසිවලට අනුකූල නොවීම**

**-------------------------------------------**

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වු නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

| නීති,රීති හා රෙගුලාසිවලට යොමුව | අනුකූල නොවීම |
|---|---|
| **(අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහය** | |
| (i) XIX වන පරිච්ඡේදයේ 6:1 වගන්තිය | පුත්තලම දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ නිලධාරීන් 13 දෙනෙකු වර්ෂ 05 කට වැඩි කාලයක සිට රජයේ නිවාසවල පදිංචිවී සිටින අතර, තවත් නිලධාරීන් 09 දෙනෙකු 2016 වර්ෂය අවසානය වනවිටද, රජයේ නිවාස ලබා ගැනීමේ පොරොත්තු ලේඛනයේ සිටින බව නිරීක්ෂණය විය. |
| (ii.) XIX වන පරිච්ඡේදයේ 5:2:1 වගන්තිය | වනාතවිල්ලුව ප්‍රාදේශීය ලේකම්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ රජයේ නිවාසයක පදිංචිව සිටින අතර, එහි නිවාස කුලිය රු.8,115 ක්ද, ආණමඩුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ ග්‍රාම සංවර්ධන නිලධාරිණියගෙන් රු.31,622 ක රජයේ නිවාස කුලියක්ද සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් අය කරගෙන නොතිබුණි. |

**(ආ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය**

| | | |
|---|---|---|
| (i) | මුදල් රෙගුලාසි 128(2) (ඇ) | සෑම අර්ධ වර්ෂයක් සඳහාම හිඟ ආදායම් වාර්තා පිළියෙල කර විගණනය වෙත ඉදිරිපත් කර නොතිබුණි. |
| (ii) | මුදල් රෙගුලාසි 389(අ) , 390 (අ) හා (ආ) | දංකොටුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලය චෙක්පත් භාරදීමේ ලේඛනයක් පවත්වා නොතිබූ අතර, චෙක්පත් පොතෙන් ඉවත් කළ පසු ආදායකයාට භාරදෙන තුරු ආරක්ෂිතව චෙක්පත් තබා ගතයුතු වුවද, විෂයය භාර නිලධාරීන් එසේ කටයුතු කර නොතිබුණි. |

**(ඇ) ජාතික ප්‍රතිපත්ති හා ආර්තික කටයුතු අමාත්‍යාංශයේ ලේකම්වරයාගේ චක්‍රලේඛ**

| | |
|---|---|
| **2015 නොවැම්බර් 26 දිනැති අංක MNPEA1/2016 දරන ජාතික ලිපිය** | නියැදි විගණන පරීක්ෂණවලදී ප්‍රාදේශීය ලේකම් කාර්යාල 08 ක් විසින් දිසාපති සමුළුවේදී ගන්නා ලද තීරණයක් පදනම් කරගෙන ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යාංශයේ ලේකම්වරයාගේ ලිපියෙන් නියමකර තිබූ ප්‍රසම්පාදන ක්‍රියාවලියෙන් බැහැරව ඇස්තමේන්තුගත වටිනාකම රු.2,952,933 ක්වූ ව්‍යාපෘති 21 ක් ඉටුකිරීමට ප්‍රජාමූලික සංවිධාන වෙත පවරා තිබුණි. |

## 3.10 දේශීය මූල්‍යකරණ මඟින් ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම

ව්‍යාපෘති ආරම්භ නොකර අත්හැර දැමීම්, ව්‍යාපෘති නිම නොකර අත්හැර දැමීම් හා ව්‍යාපෘති ප්‍රමාදයන් පිළිබඳව නියැදි විගණන පරීක්ෂණවලදී අනාවරණය වූ අවස්ථා පහත දැක්වේ.

**(අ) ව්‍යාපෘති ආරම්භ නොකර අත්හැර දැමීම**

විගණනයට ලද තොරතුරුවලට අනුව, වයඹ සංවර්ධන අමාත්‍යාංශයේ ප්‍රතිපාදන මත දංකොටුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ මැල්ලව මිල්ලගහ වත්ත 4 වන අතුරු මාර්ගය තාරදමා සංවර්ධනය කිරීමට රු.810,000 ක පිරිවැය ඇස්තමේන්තුවක් මත වෙන්නප්පුව ප්‍රාදේශීය සභාවට 2016 දෙසැම්බර් 15 දින වැඩ ආරම්භ කිරීමට භාරදී තිබුණද, කාලය ප්‍රමාණවත් නොවීම නිසා එම ව්‍යාපෘති ක්‍රියාත්මක කර නොතිබුණි.

**(ආ) ව්‍යාපෘති නිම නොකර අත්හැර දැමීම**

විගණනය වෙත ලද තොරතුරුවලට අනුව, ආරච්චිකට්ටුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ බණ්ඩාරහේන ධම්මාලෝක විදුහලේ කාර්යාල ගොඩනැගිල්ල ඉදිකිරීම සඳහා එහි පාසැල් සංවර්ධන සමිතියට රු.409,357 ක ඇස්තමේන්තවක් මත පවරා තිබූ අතර, එහි වැඩ 2016

ඔක්තෝබර් 19 දින ආරම්භ කර තිබුණද, අමුද්‍රව්‍ය හා ශ්‍රමය සපයා ගැනීමට අපහසුතාවය මත නිම නොකර අත්හැර තිබුණි.

**(ඇ) ව්‍යාපෘති ඉටුකිරීමේ ප්‍රමාදයන්**

විගණනය වෙත ලද තොරතුරුවලට අනුව, හලාවත ප්‍රාදේශීය ලේකම් කාර්යාලය මඟින් ක්‍රියාත්මක කරන ලද පහත සඳහන් ව්‍යාපෘති දෙක නියමිත කාලවකවානු තුළ ඉටුකර නොතිබුණු බව නිරීක්ෂණය විය.

| ව්‍යාපෘතිය | ඇස්තමේන්තුගත පිරිවැය | ආරම්භ කළ දිනය | නිමකළ යුතු දිනය | ප්‍රමාදයට හේතු |
|---|---|---|---|---|
| | රු. | | | |
| හලාවත එගොඩවැල්ල සිට කුරුසපාඩුව දක්වා දක්වා ධීවර තොටුපල ආවරණ මඩු ඉදිකිරීම අංක 05 | 1,503,810 | 2016.11.08 | 2016.12.08 | පාරිසරික හා සමාජීය ගැටළු මතුවීම. |
| හලාවත එගොඩවැල්ල සිට කුරුසපාඩුව දක්වා ධීවර තොටුපල ආවරණ මඩු ඉදිකිරීම අංක 01 | 307,976 | 2016.11.08 | 2016.12.08 | පාරිසරික හා සමාජීය ගැටළු මතුවීම. |

**(ඈ) මුදල් නිදහස් කර තිබුණත් ප්‍රගතියක් ලබා නොතිබුණු ව්‍යාපෘති**

විගණනයට ලද තොරතුරුවලට අනුව, වෙන්නප්පුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ බටහිර නයිනමඩම ග්‍රාම නිලධාරී වසමේ "ගමින් ගමට දොරින් දොරට" වැඩසටහන යටතේ වැව රවුම අසල නළ ළිඳක් ඉදිකිරීමට රු.980,000 ක ඇස්තමේන්තුවක් මත රු.971,121 ක් ජාතික ජල සම්පාදන හා ජලාප්‍රවාහන මණ්ඩලයට ප්‍රතිපාදන නිදහස් කර තිබුණද, ප්‍රදේශයේ ගොවි සංවිධානයේ විරෝධතාවය මත එය ඉටුකර නොතිබුණි.

**(ඉ) කාල පමාවකින් පසුව වැඩ නිමකර තිබුණු ව්‍යාපෘති**

විගණනය වෙත ලද තොරතුරුවලට අනුව පුත්තලම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ පහත සඳහන් ව්‍යාපෘති 06 ක් කාල පමාවකින් පසු වැඩ නිමකර තිබුණි.

| ව්‍යාපෘතිය | ලබාදී ඇති මුදල | වැඩ ආරම්භ කළයුතු දිනය | ප්‍රමාද කාලය |
|---|---|---|---|
| | රු. | රු. | දින |
| කලපු පාර කාණු පද්ධතිය ඉදිකිරීම | 99,000 | 2016.08.18 | 03 |

| | | | |
|---|---|---|---|
| තුන්වන හරස් වීදිය මවුලා මස්ජිත් අසල බෝක්කුව අළුත්වැඩියාව | 548,565 | 2016.08.18 | 32 |
| මානවේරිය අක්කර 40 ප්‍රධානපාර ග්‍රේඩර් කර බොරළු දැමීම | 97,614 | 2016.10.31 | 27 |
| මදුරගම රේණුකා මාර්ගය ග්‍රේඩර් කර බොරළු දැමීම | 83,300 | 2016.08.18 | 68 |
| තිල්අඩිය මස්ජිත් මහජරින් දහම් පාසල් මිදුලට ගල් ඇතිරීම | 194,000 | 2016.10.31 | 29 |
| පු/අනාගාරික විදුහලේ වැසිකිළි 2ක් ඉදිකිරීම | 148,654 | 2016.08.18 | 44 |

**(ඊ) කොන්ත්‍රාත් ඉටුකිරීමේ දුර්වලතා**

ප්‍රාදේශීය ලේකම් කාර්යාල 08 ක් විසින් ඉටුකර තිබුණු ව්‍යාපෘති 12 ක පහත සඳහන් දුර්වලතාවයන් නිරීක්ෂණය විය.

| ප්‍රාදේශීය ලේකම් කාර්යාලය | ව්‍යාපෘතිය | ඇස්තමේන්තුගත වියදම | වියදම | දුර්වලතාවයන් |
|---|---|---|---|---|
| | | රු. | රු. | |
| ආණමඩුව | අසංක මයාගේ නිවස අසල බෝක්කුව ඉදිකිරීම | -- | 77,593 | මාර්ගයේ උස් ස්ථානයක බෝක්කුව ඉදිකිරීම නිසා අපේක්ෂිත අරමුණු ඉටුවී නොතිබුණි. |
| පුත්තලම | ගොවි සමිති ශාලාවක වැඩ නිමකිරීම | 150,000 | 150,000 | ගොවි සංවිධානයක අරමුදල් යොදවා ඉදිකිරීම ආරම්භ කර තිබූ ගොවි සංවිධාන සමිති ශාලාවක වහලය මට්ටම දක්වා පමණක් ඉදිකිරීම සිදුකර තිබුණි. |
| පුත්තලම | කොට්ඨාශයේ ඇළ මාර්ග දෙකක ප්‍රතිසංස්කරණ කටයුතු | 1,930,460 | 1,930,460 | ඇළ මාර්ග දෙකෙහි මැද කොටස පමණක් ප්‍රතිසංස්කරණය කර තිබුණද, ඒවායේ වැඩි කොටසක් ගොඩවීම නිසා එහි අවසන් කොටසේ ප්‍රතිසංස්කරණය සිදු නොකිරීම නිසා ජලය බැස යාම සිදු වී නොතිබුණි. |

| | | | | |
|---|---|---|---|---|
| වනාතවිල්ලුව | ජලීල් මයාගේ නිවස අසල සිට ප්‍රධාන මාර්ගය දක්වා පාර කුට්ටිගල් ඇල්ලීම | 915,965 | පරීක්ෂණ අවස්ථාවේදී ගෙවා නොතිබුණි | **i.** මාර්ගය මීටර් 110 දිගට හා මීටර් 3 පළලට කුට්ටිගල් ඇල්ලිය යුතු වුවද, පාරේ සමහර ස්ථාන මීටර් 2.98, 2.97 පළලට ඉදිකර ඇති බවද, දෙපස කර්බ් අඟල් 6 පළලින් ඉදිකල යුතු වුවද, එහි පළල අඟල් 4 සිට 5.5 දක්වා පරාසයකින් යුතුව ඉදිකර තිබූ බව ක්ෂේත්‍ර පරීක්ෂාවේදී නිරීක්ෂණය විය.<br><br>ii. පාර දෙපස උරහිස්වලට ප්‍රමාණවත් පරිදි බොරළු යොදා තැලීම සිදුකර නොමැති බවද, එම නිසා එය මාර්ගයේ පැවැත්මට අධික ලෙස බලපාන බවද නිරීක්ෂණය විය.<br><br>iii. මාර්ගයේ ස්ථාන කිපයක අල්ලා තිබූ කුට්ටිගල් දෙපස බැම්වලට (කර්බ්) ඉහළින් හා පහළින් නිම කිරීම නිසා මාර්ග තලයේ ඒකාකාරී බව ගිලිහී තිබුණි.<br><br>**iv.** මෙම කර්මාන්තයට අදාළව නඩත්තු සටහන් පොතක් පවත්වා නොමැති නිසා කාර්මික නිලධාරීන්ගේ අධීක්ෂණය දුන් උපදෙස් නොමැති නිසා කර්මාන්ත අධීක්ෂණ කටයුතු දුර්වල මට්ටමක පැවති බව නිරීක්ෂණය විය. |
| වනාතවිල්ලුව | කරඩිපුවල් මල්ටි ෆාම් රාජිද නයනි මියගේ නිවස අසල මාර්ගය කුට්ටිගල් අල්ලා | 985,800 | පරීක්ෂණ අවස්ථාවේදී ගෙවා නොතිබුණි | i. මෙම මාර්ගය 2016 නොවැම්බර් 25 දින වන විට නිමකර භාරදිය යුතුව තිබූ අතර, එහි |

| | |
|---|---|
| සංවර්ධනය කිරීම | වැඩ 2016 දෙසැම්බර් 08 දිනටත් නිමකර නොතිබූ අතර, කාලය දිගුකරවා ගැනීමද සිදුකර නොතිබුණි.<br><br>ii. මාර්ගය දෙපස "කර්බ්" බැම්ම අඟල් 5 ක් පොලව මට්ටමින් යටටත් අඟල් 4 ක් පොලව මට්ටමින් උඩටත් සිටින ලෙස ඉදිකල යුතු වුවද, සමහර ස්ථානවල එහි සම්පූර්ණ උස 5.5 කින් ඉදිකර තිබුණි.<br><br>iii. ක්ෂේත්‍ර පරීක්ෂණය සිදුකළ 2016 දෙසැම්බර් 08 දින වන විටත් මාර්ගය ආරම්භයේ සිට අවසානය දක්වා කුට්ටිගල් ඇතිරීම සිදුකර තිබුණි.<br><br>iv. ක්ෂේත්‍ර පරීක්ෂණය සිදුකළ 2016 දෙසැම්බර් 08 දින වන විටත් මාර්ගය ආරම්භයේ සිට අවසානය දක්වා කුට්ටිගල් ඇතිරීම සිදුකර තිබුණි.<br><br>v. එසේ කුට්ටිගල් අතුරා ඇති ස්ථානවලද ඇස්තමේන්තුව පරිදි මාර්ග තලයට කළුගල් කුඩු යොදා මට්ටම් කර නොතිබුණි.<br><br>vi. පාර ආරම්භයේ සිට ගම්මානය දෙසට යනවිට දකුණු පස ස්ථානයකින් "කර්බ්" බැම්ම ජලය බැස යන කාණුව දෙසට |

| | | | | |
|---|---|---|---|---|
| | | | | නෙරා ඇලවී ගොස් තිබුණි. එසේම යොදා ගන්නා කුට්ටිගල් ඒ සඳහා සුදුසුබවට රසායනාගාර තත්ත්ව පරීක්ෂණ වාර්තාවක්ද ලබාගෙන තිබුණි. |
| මුන්දලම | නල්ලන්දළුව ප්‍රාථමික විද්‍යාලය අසල මාර්ගය කොන්ක්‍රීට් කිරීම | 1,931,459 | පරීක්ෂණ අවස්ථාවේ ගෙවීම් කර නොතිබුණි | i. පාර සඳහා යොදා තිබූ කොන්ක්‍රීට් මිශ්‍රණයට යොදා ගෙන තිබූ වැලිවල මැටිද අඩංගුව තිබීම නිසා මාර්ග තලයේ කුඩාවලවල් නිර්මාණය වී තිබුණි.<br>ii. මාර්ග තලයේ නියමිත දුරින් නියමිත පරිදි ප්‍රසාරණ මුට්ටු යොදා නොතිබුණි. |
| නවගත්තේගම | මහඅන්දරවැව පානීය ජල ව්‍යාපෘතිය | 4,389,804 | 4,389,804<br>71,938 | මෙම පානීය ජල ව්‍යාපෘතියේ නල මාර්ගය අවහිර වි තිබිම නිසා 2016 ග්‍රාමීය යටිතල පහසුකම් වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය යටතේ රු.71,938 ක් වැයකර තිබුණද, එහි අනෙකුත් ඉදිකිරීම් අවසන් කර නොතිබීම නිසා ප්‍රතිලාභ ලබාගත නොහැකිව තිබුණි. |
| නවගත්තේගම | මහමැද්දැව ජල ව්‍යාපෘතිය - ලිඳ ඉදිකිරීම | 438,592 | 438,592 | මෙහි ලිඳ ඉදිකර තිබුණද, ජල ටැංකිය, නල පද්ධතිය ඉදිකර නොතිබූ අතර, ජල මෝටර්ද සපයා සවිකර නොතිබුණි. |
| මාදම්පේ | ඉහළගම සණස බැංකුව අසල පාරට පෙර සවි කුට්ටිගල් අල්ලා සංවර්ධනය කිරීම | 323,735 | 288,849 | i. අඟල් 6 ක් පළලට හා අඟල් 09 ක් උසට (පොලොවෙන් යට සිට) දෙපස "කර්බ්" බැම්ම යෙදිය යුතු වුවද, අඟල් 4 ක් උසට පමණක් එය ඉටුකිරීම නිසා රු.20,845 ක් වැඩිපුර ගෙවා තිබුණි. |

| | | | | |
|---|---|---|---|---|
| | | | | ii. ඉහත අයුරින් "කර්බ්" බැම්ම යෙදිම නිසා සැටරින් සඳහා රු.3,754 ක් වැඩිපුර ගෙවා තිබුණි.<br><br>iii. "කර්බ්" බැම්ම සඳහා අත්තිවාරම් කැපීම සිදු නොකර එය පොලව මට්ටමේ සිට යොදා තිබීම නිසා එයට රු.1,101 ක් වැඩිපුර ගෙවා තිබුණි.<br><br>iv. පෙර සවි කට්ටිගල් අඩි 122 ක් ඇතිරීමට ගෙවා තිබුණද, අතරා ඇත්තේ අඩි 120 ½ දුරට බැවින් ඒ සඳහා රු.2,628 ක් වැඩිපුර ගෙවා තිබුණි.<br><br>v. පාර දෙපස උරහිස්වලට ප්‍රමාණවත්ව බොරළු ඇස්තමේන්තු කර නොමැති අතර, අතුරා තිබු බොරළුද තැලීම සිදුකර නොතිබුණි. |
| මාදම්පේ | ඉලංගමුදලි මහත්මියගේ නිවස දක්වා පාරට පෙරසවි කුට්ටිගල් ඇතිරීම | 659,247 | 655,980 | i. අහල් 6 ක් පළලට අහල් 09 ක් උසට (පොලව යටට අහල් 5 ක් වන පරිදි) කොන්ක්‍රීට් කර්බ් බැව් ඉදිකර ඇත්තේ අහල් 4 උසට පමණි. (පොලොව මට්ටමේ සිට උඩට පමණි) එම නිසා ඒ සඳහා රු.51,544 වැඩිපුර ගෙවා තිබුණි.<br><br>ii. ඉහත කර්බ් ඉදිකිරීම නිසා ෂටරින් රු.8,555 ක් වැඩිපුර ගෙවා තිබුණි. |

| | | | | |
|---|---|---|---|---|
| | | | | iii. ඉහත (i) හි දැක්වූ පරිදි කර්බ් බැම්ම සඳහා අත්තිවාරම් කාණු කපා නැති නිසා ඒ සඳහා ගෙවා තිබූ රු.2,739 ක මුදල වැඩිපුර ගෙවීමක්ව තිබුණි.<br><br>iv. වැඩ ප්‍රමාණ පත්‍රය අනුව දික් අඩි 317 ක් දිගට පළල අඩි 6.6 ක් ලෙස ගෙවීම් කර තිබුණද පාරේ පළල අඩි 5 අඟල් 10 සිට අඩි 6 ½ දක්වා පරාසයක් ගෙන තිබුණි.<br><br>v. දෙපස උරහිස්වලට ප්‍රමාණවත් පරිදි බොරළු දමා තලා නොතිබුණි. |
| වෙන්නප්පුව | වෛක්කාල රජයේ විදුහලේ ක්‍රීඩා මණ්ඩපය ඉදිකිරීම | 978,838 | 973,847 | i. ක්‍රීඩා මණ්ඩපයේ ඉදිරිපස ගඩොල් බිත්තිය කොන්ක්‍රීට් ලින්ටලය සමඟ ඉහල සිට අත්තිවාරම දක්වා පුපුරා තිබුණි.<br><br>ii. අමතර වැඩ අයිතම 3 යටතේ වූ ඇලුමිනියම් පීලි (AL Gutters) සම්බන්ධ කළ ස්ථාන 3කින් ජලය කාන්දුවීම සිදුවන බව නිරීක්ෂණය විය.<br><br>iii. මෙම කර්මාන්තයේදී ඉටුකර තිබූ කොන්ක්‍රීට් "කොලම්ස්" හා "බීම්ස්" නිසි ප්‍රමිතියකින් තොරව ගල් මතුවන ලෙසට ඉදිකර තිබුණි. |
| වෙන්නප්පුව | ගිංඔය අසල ප්‍රජා ශාලාව ඉදිකිරීම | 979,977 | 783,987 | i. වහලයේ මුදුන් උළුවල කුමේර බැඳ නොතිබුණද ඒ සඳහා රු.9,761 ක් ගෙවා තිබුණි. |

i. ඇස්තමේන්තුව අනුව වහලය රැඳවීම සඳහා යකඩ කාප්ප 02 ක් යොදා ඉදිකල යුතු වුවද, ඒ සඳහා අනුමැතියකින් තොරව ලී කාප්ප 02 ක් යොදා තිබුණි.

**3.11 මතභේදයට තුඩුදෙන ගනුදෙනු**

--------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) නවගත්තේගම ප්‍රාදේශීය සභා බලප්‍රදේශයේ ජනනය වන කසලවලින් කොම්පෝස්ට් පොහොර නිෂ්පාදනය කිරීමේ ව්‍යාපෘතියක් ආරම්භ කිරීම සඳහා ඉඩමක් ලබාදෙන බවට නවගත්තේගම ප්‍රාදේශීය ලේකම් දැක්වූ එකඟතාවය මත 2016 වර්ෂයේදී මධ්‍යම පරිසර අධිකාරියේ පිළිසරු ව්‍යාපෘතිය මගින් රු.1,776,351 ක ප්‍රතිපාදන නවගත්තේගම ප්රාදේශීය සභාවට ලබාදී තිබුණි. ඉඩම ලබාදීම ප්‍රමාද වීම මත එකී ප්‍රතිපාදන ආපසු පවරාගෙන තිබුණි. යෝජිත ඉඩමේ මැණුම් කටයුතු වෙනුවෙන් ප්‍රාදේශිය සභාව රු.57,500 ක් වැය කර තිබුණි.

(ආ) 2014 වර්ෂයේ දැයට කිරුළ යටතේ ඉදිකර තිබූ නවගත්තේගම රංගශාලාව ප්‍රාදේශීය සභාවට පවරන බවට නවගත්තේගම ප්‍රාදේශීය ලේකම්වරයා දෙන ලද ලිඛිත පොරොන්දුවක් මත එය ජනතා අයිතියට පත් කිරීමට පෙර භූමිය සැකසීම හා වෙනත් කටයුතු වෙනුවෙන් ප්‍රාදේශීය සභාව රු.300,204 ක් වැය කර තිබුණි. පසුව මෙම රංග ශාලාව ප්‍රාදේශීය සභාවට පැවරීම දිස්ත්‍රික් ලේකම්වරයා ප්‍රතික්ෂේප කිරීම මත සභාව වැය කර තිබූ මුදලට සියයට 25 ක් ද, සමඟ රු.375,255 ක් ආපසු ලබාදෙන ලෙස දන්වා තිබුණද, ප්‍රාදේශීය ලේකම්වරයා විසින් එම ඉල්ලීම සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් ඉටු කර නොතිබුණි.

(ඇ) 2015 වර්ෂයේදී සිදුකර තිබූ විශ්‍රාම වැටුප් සංශෝධනයේ දත්ත පරිගණකගත කිරීමේදී මාදම්පේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ නිලධාරීන්ගේ නොසැළකිල්ල හේතුවෙන් විදුහල්පතිවරයෙකුගේ හා කම්කරුවෙකුගේ දත්ත මාරුකර ඇතුළත් කිරීම නිසා 2015 අගෝස්තු මාසයේ සිට 2017 මාර්තු මාසය දක්වා විදුහල්පතිවරයාට රු.114,025 ක් අඩුවෙන් හා කම්කරුවාට රු.82,856 ක් වැඩියෙන්ද ගෙවා තිබුණි.

**3.12 අවිධිමත් ගනුදෙනු**

-------------------

**රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ ක්‍රියා පටිපාටියෙන් බැහැරවීම**

-----------------------------------------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) කල්පිටිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලය රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 2:14:1 මාර්ගෝපදේශයේ හා 3:4:2(ආ) මාර්ගෝපදේශයේ විධිවිධානවලට පටහැනිව එක් කොන්ත්‍රාත්කරුවෙකුගේ ලංසු පිළිගෙන රු.7,002,289 ක් වූ කොන්ත්‍රාත්තු 13 ක් ප්‍රදානය කර තිබුණි.

(ආ) මහකුඹුක්කඩවල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ ඉටුකර තිබූ ව්‍යාපෘති 25 ක් පිළිබඳව සිදුකළ නියැදි පරීක්ෂාවේදී රු.500,000 කට අඩු ව්‍යාපෘති 22 ක් හා රු.1,000,000 ක ව්‍යාපෘති 03 ක කොන්ත්‍රාත් සඳහා රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 2:14:1 මාර්ගෝපදේශයේ විධිවිධානවලට පටහැනිව එකී මිල ගණනක් ලැබී තිබුණද, ඊට කොන්ත්‍රාත් ප්‍රදානය කිරීමට කටයුතු කර තිබුණි. එමෙන්ම එක් කොන්ත්‍රාත්කරුවකුට කොන්ත්‍රාත් 15 ක් ප්‍රදානය කර තිබුණි.

(ඇ) වනාතවිල්ලුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලය රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 5:4:8(ආ) මාර්ගෝපදේශයේ විධිවිධානවලට පටහැනිව එක් කොන්ත්‍රාත්තුවකට අදාළව ලබාගෙන තිබු ආරක්ෂිත ඇපකරය කර්මාන්තය නිමකළ යුතු දිනයටද මාස 03 ඉක්මවා ලබාගත යුතුව තිබුණද, එසේ කර නොතිබුණි.

(ඇ) නවගත්තේගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ රු.2,865,862 ක් වූ ව්‍යාපෘති 05 ක් සඳහා එක් කොන්ත්‍රාත්කරුවකු පමණක් ඉදිරිපත් වී තිබූ අතර, රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 3:4:2(ආ) මාර්ගෝපදේශ පටහැනිව ඔහුට එම කොන්ත්‍රාත්තුව ප්‍රදානය කර තිබුණි.

**3.13 පාඩු හා හානි**

--------------

ඉහිණිමිටිය ව්‍යාපාරය යටතේ කොන්කඩවල ගමේ ආ.ග.පි.3218 දරන පිඹුරට අයත් අංක 327 සිට 331 දක්වා ඉඩම් කැබලි 1980 වර්ෂයේ දී රජයට පවරාගෙන තිබුණි. ඒවාට වන්දි වශයෙන් 2014 වර්ෂයේදී රු.725,070 ක් ගෙවීම සඳහා කාර්යාලයට ලැබී තිබුණි. අයිතිය පිළිබඳ ආරවුල් තත්ත්වයක් නිසා 2014 වර්ෂයේදී එම මුදල පොදු තැන්පත් ගිණුමට බැරකර තිබුණද, 1950 අංක 9 දරන ඉඩම් අත්පත් කරගැනීමේ පනතේ 10 හා 11 වගන්ති අනුව එම මුදල් අධිකරණයේ තැන්පත් කිරීමට අවශ්‍ය පුවත්පත් දැන්වීම් පලකිරීමට එවකට සිටි නිලධාරීන් කටයුතු කර නොතිබුණි. මේ නිසා එය අධිකරණයේ තැන්පත් කර නොතිබුණි. පසුව මෙම ආරවුල නිරවුල් වී තිබූ අතර, ඉඩම් අත්පත් කර ගැනීමේ පනතේ 17 වන වගන්තියට අනුව නියමිත කාලය තුළ වන්දි ප්‍රදානය කිරීම සිදුනොකිරීම හේතුවෙන් ඉඩම් අයිතිකරුවන්ට වන්දි මුදලට අමතරව රු.2,554,327 ක පොලියක්ද, ගෙවීමට සිදුවී තිබුණි. මේ අනුව රු.2,554,327 ක අමතර වැයක් රජයට සිදු කර තිබුණි.

**3.14 අනාර්ථික ගනුදෙනු**

---------------------

නියැදි විගණන පරීක්ෂණවලදී අනාවරණය වු අරපිරිමැස්මෙන් තොරව එළඹ තිබුණු ගනුදෙනු පිළිබඳ විස්තර පහත දැක්වේ.

(අ) දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ මෙහෙයවීමෙන් ආණමඩුව රංග ශාලාව ඉදිකිරීම අධියර 01 යටතේ රු.18,149,912 කට වහලය දක්වා ඉදිකිරීම සිදුකිරීමට කොන්ත්‍රාත්තුව ප්‍රධානය කර තිබුණි. ඒ සඳහා අමතර වැඩද ඇතුළුව රු.22,179,685 ක් ගෙවා තිබුණි. එහි දෙවන පියවර ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය ප්‍රතිපාදන ලබා නොගැනිම නිසා එහි වැඩ අවසන් කර ප්‍රයෝජනයට ගැනිමට නොහැකි වී තිබුණි. කෙසේ වෙතත් වර්ෂ 02 කට අධික කාලයක් ස්වභාවික ආපදාවලට ලක්වීම නිසා ක්‍රමයෙන් ගරා වැටීමේ තත්ත්වයට පත්ව තිබූ අතර, භූමියද වල් බිහිවී තිබුණි.

(ආ) කල්පිටිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ කරඹ ප්‍රදේශයේ පානීය ජල යෝජනා ක්‍රමයක් සඳහා නල ළිඳක් ඉදිකිරීමට සමෘද්ධි අධිකාරියේ හා ජාතිය ගොඩනැඟිමේ අමාත්‍යාංශයෙන් රු.1,751,358 ක් අත්තිකාරම් ජාතික ජල සම්පත් මණ්ඩලයට ගෙවා තිබුණි. තාක්ෂණික දෝෂයක් හේතුවෙන් ළිඳේ ජලය ප්‍රයෝජනයට ගැනීමට නොහැකි වී තිබුණි. පෞද්ගලික

ඉඩමක තිබූ නල ළිං දෙකක් ඒ සඳහා ප්‍රයෝජනයට ගැනීමට පසුව යෝජනා වී තිබූ අතර, එහි ජලය පරීක්ෂා කිරීමේ ගාස්තු ලෙස රු.536,130 ක් ගෙවා තිබුණු අත්තිකාරම් මුදලෙන් ජල සම්පත් මණ්ඩලය අඩුකර ගැනීමට කටයුතු කර තිබුණි. ඉතිරි රු.1,215,228 ක් ආපසු ලබාදෙන ලෙස ඉල්ලීම් කළද, එය සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් නිරවුල් කිරීමට ජල සම්පත් මණ්ඩලය කටයුතු කර නොතිබුණි.

(ඈ) කල්පිටිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ "ඩච්බේ" ග්‍රාම නිලධාරි වසමේ නිවාස 48 ක අභ්‍යන්තර අවතැන්වූවන්ගේ සුභසාධනය වෙනුවෙන් ඉදිකිරීමට නැවත පදිංචි කිරීමේ අමාත්‍යාංශයෙන් රු.2,560,000 ලබාදී තිබුණද, බල ප්‍රදේශයේ ඉඩම් සංචාරක සංවර්ධන අධිකාරියට පවරා තිබීම නිසා නිවාස ඉදිකිරීම සඳහා එම අධිකාරියේ අනුමැතිය ලැබී නොතිබුණි.

(ඇ) 2014 වර්ෂයේ දැයට කිරුළ ප්‍රතිපාදන උපයෝගී කර ගෙන රු.972,356 කට ඉටුකිරීමට ගිවිසුම්ගතව මහකුඹුක්කඩවල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ කොකිච්චන්කුලම පානීය ජල ළිඳ ඉදිකිරීම ජල සම්පත් මණ්ඩලයේ උපදෙස් අනුව සිදුකර තිබුණි. එහි ප්‍රමාණවත් ජලයක් නොමැතිවීම නිසා ඉදිකිරීම් අත්හිටුවා තිබුණි. ඒ සඳහා රු.382,666 ක් වැය කර තිබුණද, ප්‍රදේශයේ ජනතාවට එහි ප්‍රතිලාභ ලබා ගැනීමට නොහැකි වී තිබුණි.

(ඉ) රජවීගම අමුණුවැව පානීය ජල ව්‍යාපෘතියට අවශ්‍ය ජලනල හා උපාංග 2013 වර්ෂයේදී රාජ්‍ය නොවන සංවිධානයකින් සපයා තිබුණද, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින්ද රු.311,186 ක වටිනා ජලනල හා උපාංග මිලදී ගෙන සපයා තිබුණි. පසුව තොරතුරු අනාවරණය වීම මත රු.247,678 ක් වටිනා ජල නල හා උපාංග ආපසු නවගත්තේගම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට ලබාදී තිබුණි. එහෙත් ඉතිරි රු.63,508 ක් වටිනා ජලනල හා උපාංග පිළිබඳ තොරතුරු සැපයීමට දිස්ත්‍රික් ලේකම්වරයා අපොහොසත් වී තිබුණි.

(ඊ) 2014 වර්ෂයේදී රු.3,176,844 ක් වැයකර ආරම්භකර තිබූ මාදම්පේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ මහගම උතුර හා තඹගල්ල ජල ව්‍යාපෘතිය හා 2015 වර්ෂයේදී රු.504,661 ක් වැයකර ආරම්භ කර තිබූ කෝන්ගස්යාය ජල ව්‍යාපෘතියේ ඉතිරි වැඩ නිමකිරීමට 2016 වර්ෂයේදී ප්‍රතිපාදන සලසා නොතිබීම නිසා ඒවායේ ප්‍රතිලාභ ප්‍රදේශයේ ජනතාවට ලැබී නොතිබුණි.

(උ) 2014 හා 2015 වර්ෂවලදී රු.3,385,692 ක් වැයකර ඉදිකර තිබූ හැවන පන්ගොඩ තිසේරා ගම්මානයේ ජල ව්‍යාපෘති දෙකෙහි ඉතිරි වැඩ සඳහා 2016 වර්ෂයේදී ප්‍රතිපාදන සලසා නොතිබීම නිසා එහි ප්‍රතිලාභ ප්‍රදේශයේ ජනතාවට අහිමි වී තිබුණි.

**3.15 කළමනාකරණ දුර්වලතා**

**---------------------------**

නියැදි විගණන පරීක්ෂණවලදී පහත සඳහන් දුර්වලතා නිරීක්ෂණය විය.

(අ) ප්‍රාදේශීය ලේකම් කාර්යාල තුනක ප්‍රතිලාභීන් වෙත ලබා දීමට එකතුව රු.714,016 ක් වටිනා භාණ්ඩ මිලදී ගෙන තිබුණි. එම භාණ්ඩ සමාලෝචිත වර්ෂය අවසානයටද ප්‍රතිලාභීන් වෙත බෙදා නොදී ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල රඳවා ගෙන තිබුණි.

(ආ) පුත්තලම ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් පොලිස් වාර්තා ලබා නොගෙන උකස් මධ්‍යස්ථාන පවත්වාගෙන යාමට බලපත්‍ර නිකුත් කර තිබුණි. එමෙන්ම කොට්ඨාශයේ උකස් මධ්‍යස්ථාන 04 කට ලබා දී තිබුණු බලපත්‍රවල කාල සීමාව අවසන් වී තිබුණු අතර රක්ෂණාවරණද ලබාගෙන නොතිබුණි.

(ඈ) මහකුඹුක්කඩවල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය මගින් 2016 ග්‍රාමීය යටිතල පහසුකම් ව්‍යාපෘතියේ ඇස්තමේන්තු සකස් කිරීමේදී ඇප හා කාර්යසාධන ඇපකරද ඇතුළත් කර ඇස්තමේන්තු පිළියෙල කර තිබුණි. ඒවාට ගෙවීම් කිරීමේදී එම ඇපකරවල මුදල්ද ඇතුළත්ව ගෙවීම් කර තිබුණි. ඊට අමතරව ඇප හා ආරක්ෂිත ඇපකර මුදලක් ලබාගෙන පොදු තැන්පත් ගිණුමේ රඳවාගෙන තිබුණි.

(ඇ) හලාවත ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් මල්වත්ත සර්විස් ආයතනය අසල මාර්ගය කුට්ටිගල් අල්ලා සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතියේ ගෙවීම් වාර්තා සකස් කිරීමේදී බාහිර ආයතන වෙත කරන ලද ගෙවීමට අදාළව එකතුකළ අගය මත බදු ගැලපීම සිදු කර නොතිබුණි. මුළු ව්‍යාපෘතිය සඳහා එම බදු ගණනය කිරීම නිසා රු.7,005 ක් වැඩිපුර ගෙවා තිබුණි.

(ඉ) මහවැව ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ නිලධාරීන්ගේ පැමිණීම හා පිටවීමට අදාළව 2016 ඔක්තෝබර් මාසයේ ඇඟිලි සලකුණු යන්ත්‍ර පරිගණක මුද්‍රිත සටහන්වලට අනුව නිලධාරීන් 06 දෙනෙකු දින 12 ක් පිටවීම නිලධාරීන්ගේ ප්‍රමාදය මත සලකුණු කර නොමැති බව නිරීක්ෂණය විය. අත්සන් ලේඛනයේ දැක්වෙන වේලාවක් පදනම් කරගෙන ඔවුන්ට අතිකාල දීමනාවද ගෙවා තිබුණි.

(ඊ) නාත්තන්ඩිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ නිලධාරීන්ගේ පැමිණීම පිටවීම සටහන් කරනු ලබන ඇඟිලි සලකුණු යන්ත්‍රයේ පරිගණක මුද්‍රිත සටහන් ලබා ගැනීමට නොහැකි වී තිබුණි.

(උ) රජයේ සේවකයකු සේවයේ යෙදී සිටියදී මියගිය විට ඔහුගේ බාලවයස්කාර දරුවන් නමින් බැංකු ගිණුම්වල තැන්පත් කරනු ලබන විශ්‍රාම ප්‍රතිලාභ එම දරුවන්ට වයස අවුරුදු 18 ක් සම්පූර්ණ වීමෙන් පසුව ඔවුන්ට ලබා දිය යුතුව තිබුණි. නමුත් එම වයස සම්පූර්ණවීමෙන් පසු වර්ෂ 15 ක සිට වර්ෂ 20 ක් දක්වා කාල පරාසයක් ගතවී තිබුණු පාස්පොත් 07 ක් 2016 ඔක්තෝබර් මාසය වන විටත් ඔවුන් වෙත නිදහස් කිරීමට වෙන්නප්පුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලය කටයුතු කර නොතිබුණි. එමෙන්ම එකතුව රු.200,640 ක් වූ ස්ථාවර තැන්පත් 06 කට අදාළ තැන්පත් සහතිකද සේප්පුවේ තිබූ අතර, ඊට අදාළ විස්තර ඉදිරිපත් කර නොතිබුණි.

**3.16 මානව සම්පත් කළමනාකරණය**

**අනුමත සේවක සංඛ්‍යාව හා තථ්‍ය සේවක සංඛ්‍යාව**

2016 දෙසැම්බර් 31 දිනට වූ සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත පරිදි විය.

| | සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|---|
| (i) | ජ්‍යෙෂ්ඨ මට්ටම | 56 | 17 | 39 |
| (ii) | තෘතියික මට්ටම | 36 | 24 | 12 |
| (iii) | ද්විතියික මට්ටම | 1,017 | 744 | 273 |
| (iv) | ප්‍රාථමික මට්ටම | 176 | 175 | 01 |
| | **එකතුව** | **1285** | **960** | **325** |

මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) අනුමත කාර්ය මණ්ඩලය අනුව අතිරේක දිස්ත්‍රික් ලේකම් (ඉඩම්) තනතුර වර්ෂ ගණනාවක සිට පුරප්පාඩුව පැවතුණි.

(ආ) කල්පිටිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ ප්‍රාදේශීය ලේකම්, පරිපාලන නිලධාරී හා ගණකාධිකාරී තනතුරු පුරප්පාඩු වී තිබුණි. එසේම පුත්තලම ප්‍රාදේශීය ලේකම් තනතුර හා දංකොටුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ පරිපාලන ග්‍රාම නිලධාරී තනතුරද පුරප්පාඩු වී තිබුණි. ඒ සඳහා පූර්ණ කාලීනව නිලධාරීන් යෙදවීමට සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් අපොහොසත් වී තිබුණි.

(ඇ) 2011 මාර්තු 24 දිනැති අංක 3/2011 දරන විශ්‍රාම වැටුප් චක්‍රලේඛය ප්‍රකාරව ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ වෙනම විශ්‍රාම වැටුප් අංශයක් පිහිටුවීම, අවශ්‍ය පහසුකම් ලබාදීම, ප්‍රමාණවත් කාර්ය මණ්ඩලයක් ලබාදීම හා මාණ්ඩලික නිලධාරියෙකුගේ සෘජු අධීක්ෂණයට යටත් කිරීම ආදිය සිදුකළ යුතු වුවත්, මාදම්පේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ විශ්‍රාම වැටුප් ගොනු 1400 ක් පමණ පවත්වාගෙන යාමට සංවර්ධන නිලධාරිණියකට පවරා තිබුණි.